# කයිසෙන්

## උපායමාර්ගය

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යංශය

NPS SRILANKA

# කයිසෙන්
## උපායමාර්ගය

ප්‍රථම මුද්‍රණය - 2011 දෙසැම්බර්

**මෙහෙයවීම :**
**ජේ.එම් තිලකා ජයසුන්දර**
**අධ්‍යක්‍ෂ,ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය**

**සම්පාදනය :**
**සුරංග ගුණරත්න**
**නියෝජ්‍ය අධ්‍යක්‍ෂ,ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය**

**ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ප්‍රකාශනයකි**

# කයිසෙන්

## (නොනවතින වර්ධනය හෙවත් අඛණ්ඩ වැඩි දියුණුව)

පළමුවන පරිච්ඡේදය

කයිසෙන් උපායමාර්ගය | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

ජපන් තරගකාරිත්ව සාර්ථකත්වයට මූලික වූ, වඩාත්ම වැදගත් තනි ජපන් කළමනාකරණ සංකල්පය ලෙස කයිසෙන් උපායමාර්ගය හැඳින්විය හැක. ආයතනයක සියළු දෙනාම එනම් ඉහළ කළමනාකාරිත්වය, කළමනාකරුවන් හා සේවකයින් සම්බන්ධ කර ගනිමින් වැඩ කරන අතරම සිදු කරන වැඩි දියුණු කිරීම් මෙහි අන්තර්ගතය.


වැඩි දියුණු කිරීමක ආරම්භක පියවර, අවශ්‍යතාවයන් හඳුනා ගැනීමයි. එය සිදුවන්නේ ගැටලු හඳුනාගැනීම තුළින්ය. ඔබ ගැටලු හඳුනා නොගතහොත්, වැඩි දියුණු කිරීම් පිළිබඳව අවශ්‍යතාවයක් මතු නොවේ. පරිපූර්ණත්වය පිළිබඳව සෑහීමකට පත්වීම කයිසෙන් ක්‍රියාත්මක කිරීමට බාධාවකි. එහෙයින් කයිසෙන් මඟින් ගැටලු පිළිබඳව දැනුවත් වීම අවධාරණය කරයි; ගැටලු හඳුනා ගැනීමට අවශ්‍ය ඉඟි සැපයීම සිදු කරයි.

මසාකි ඉමායි
(Gemba kaizen ග්‍රන්ථයේ කර්තෘ)

## 1.0 කයිසෙන් හැඳින්වීම

අපි සැවොම වර්තමානයේ සිටින තත්ත්වයට වඩා ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් දියුණුවීමට කැමති වෙමු. තනි පුද්ගලයෙක්, පවුලක්, ආයතනයක්, සංවිධානයක් හෝ රාජ්‍යයක් යන කවරෙකු වුවත් වර්තමානයට වඩා දීප්තිමත් අනාගතයක් අපේක්ෂා කිරිම සාධාරණය. එලෙස දිනෙන් දින දියුණු වීම සඳහා එසේත් නැතිනම් පවතින තත්ත්වයේ සාධනීය වෙනස්කම් සිදු කර වඩාත් යහපත් ප්‍රතිඵල ලබාගැනිම සඳහා ඉවහල් වන සරල, පහසු, වියදම් අඩු ක්‍රමවේද රාශියක් ඵලදායිතා ශිල්ප යටතේ අඩංගුය. ඉන් වඩාත් කැපී පෙනෙන උපායමාර්ග යක් ලෙස කයිසෙන් හැඳින්විය හැක.

ඵලදායිතාව ගැන කතා කරන විට 5S සංකල්පය සේ ම නිතරම මුවග රැව්දෙන වදනක් ලෙස “ කයිසෙන් ” දැක්විය හැක. කයිසෙන් යන පදය ජපන් භාෂාවේ වදනක් වන අතර එහි අර්ථය පහත පරිදි වේ.




Kai යන්නෙන් Change – වෙනසක් සිදු වීම අදහස් කරයි. Zen යන පදයෙන් අදහස් වන්නේ Better එසේත් නැතිනම් යහපත් යන අර්ථය යි. ඒ අනුව Kaizen යනු “යහපත් ලෙස සිදු වන වෙනසක්” ලෙස හැඳින්විය හැක. සිදුවන වෙනස සුභ-වාදී වෙනසක් නම් අනිවාර්ය දියුණුවක් සිදු වේ. පවතින තත්ත්වය තව තවත් වැඩි දියුණු වෙමින් සිදුවන වෙනසක්, කයිසෙන් ලෙස හැඳින්විය හැක.

කයිසෙන් යන්නට දී ඇති සරල ම අර්ථකථනය වන්නේ “අඛණ්ඩ වැඩි දියුණුවයි”. එය ඉංග්‍රීසි භාෂාවෙන් Continues Improvement ලෙස හැඳින් වේ. සුළු සුළු වැඩි දියුණු කිරීම් මඟින් ඊයෙට වඩා අද හොඳ යහපත් දියුණුවක් ලබා ගැනීමටත් අදට වඩා හෙට යහපත් දියුණුවක් ලබා ගැනීමටත් කයිසෙන් සංකල්පය ඉවහල් වේ.

කයිසෙන් මෙතරම් ජනප්‍රිය වීමට හේතුවක් වන්නේ එහි ඇති සරල බව යි. ඕනෑම අධ්‍යාපන මට්ටමකට, පවුල් පසුබිමකට, සාමාජීය හා ආර්ථික මට්ටමකට කයිසෙන් ක්‍රියාත්මක කළ හැකිය. ඔබගේ පුද්ගලික ජීවිතයට, නිවසට, පාසලට, කාර්යාලයට, කර්මාන්තශාලාවට, වැඩබිමට කයිසෙන් සංකල්පය හඳුන්වා දීමෙන් ලැබිය හැකි අමිල ප්‍රතිලාභ රාශියකි. කයිසෙන් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වාසි කිහිපයක් පහත පරිදි දැක්විය හැක.

I. ක්‍රියාත්මක කිරීම පහසු වීම.
කයිසෙන් ක්‍රමයේ අප යොමු වන්නේ සුළු සුළු වැඩි දියුණු කිරීම් කෙරෙහි ය. එම නිසා විශේෂඥ දැනුම, ඉංජිනේරුමය දැනුම අත්‍යවශ්‍ය සාධකයක් නොවේ.

ii. වියදම අඩු වීම
කයිසෙන් ක්‍රමය යටතේ සුළු වැඩි දියුණු වීම් සඳහා අප ක්‍රියාත්මක වන නිසා අඩු ප්‍රාග්ධනයකින් යෝජනා ක්‍රියාත්මක කළ හැක.

iii. ඉක්මණින් ක්‍රියාත්මක කළ හැකි වීම
යෝජනාවල සරල බව නිසාත්, අධික වියදම් අවශ්‍ය නොවන නිසාත් කෙටි කාලයකින් ක්‍රියාත්මක කළ හැක.

iv. කෙටි කාලයකින් ප්‍රතිඵල ලැබීම.
කයිසෙන් වැඩසටහනක් තුළින් කෙටි කාලයකින් ප්‍රතිඵල ලබා ගත හැකි වීම එහි සුවිශේෂී වාසියකි. මෙහි මිනුම් කළ හැකි (tangible) ප්‍රතිඵල කෙටි කාලීනව ද සහ මිනුම් කළ නොහැකි ( intangible ) ප්‍රතිඵල දිගු කාලීනව ද ලැබේ.

v. ඵලදායිතාව වර්ධනය වීම
කයිසෙන් ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනයක ඵලදායිතාව වර්ධනය වේ. එනම් කාර්යක්ෂමතාව, සඵලතාවය සහ ගුණාත්මකභාවය වර්ධනය වන අතර නාස්තීන් හා වියදම් අඩුවේ.

vi. යහපත් වැඩ පරිසරයක් ගොඩ නැගීම
යම් ආයතනයක කයිසෙන් ක්‍රියාත්මක කළ විට යහපත් වැඩ පරිසරයක් බිහි වී හදිසි අනතුරු ආදිය අඩු වන අතර සේවක චිත්ත ධෛර්යය (Morale) ඉහළ යෑමක් ද සිදුවේ.

පෙර සඳහන් කළ පරිදි කයිසෙන් යන පදයෙන් අදහස් වන්නේ "අඛණ්ඩ වැඩි දියුණුව යි". මේ අනුව පළමුව සිදු විය යුත්තේ "වැඩි දියුණු විය යුතු" අවස්ථා හඳුනා ගැනීමයි. එලෙස වැඩි දියුණු විය යුතු අවස්ථා පහත පරිදි දැක්විය හැක.

(1) ඵලදායිතාව ඉහළ නැංවීම
(2) ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
(3) පිරිවැය අඩු කිරීම.
(4) භාණ්ඩ හා සේවා බෙදා හැරීම වැඩි දියුණු කිරීම.
(5) නිරපදතාවය (Safety) ඉහළ නැංවීම.

ඔබ කයිසෙන් වැඩසටහනක් ක්‍රියාත්මක කරන විට මෙම අංශ වැඩි දියුණුව කෙරෙහි අවධානය යොමු කරන අතර ම චිත්ත ධෛර්යය (Morale) වැඩි දියුණු කිරීමට කටයුතු කිරීමත් වැදගත් ය.
ජපන් කළමනාකරණ ක්‍රම හා බටහිර කළමනාකරණ ක්‍රම අතර මූලික වෙනසක් ලෙස කයිසෙන් හැඳින්විය හැක. කයිසෙන්හි දී ක්‍රියාවලි අරමුණු කරගත් වැඩි දියුණුවක් අපේක්‍ෂා කරන අතර බටහිර කළමනාකරණයේ දී දක්නට ඇත්තේ ප්‍රතිඵල අරමුණු කරගත් නව්‍යකරණය (Innovation) මත පදනම් වූ ක්‍රියාවලියකි.

## 1.2 Kaizen වලට ආවේණික ලක්‍ෂණ

1. කයිසෙන් යටතේ දී කුඩා වැඩි දියුණු කිරීම්වලට අවධානය යොමු කරයි. යම්කිසි ක්‍රියාවලියක හෝ උපකරණයක විශාල වෙනස්කම් සිදු නොකරමින් සහ විශාල ප්‍රාග්ධනයක් වැය නොකරමින් කයිසෙන් ක්‍රියාත්මක කළ හැක. තවද තනි පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට වුවත් පහසුවෙන් කයිසෙන් ක්‍රියාත්මක කළ හැක.

2. නිරන්තර වැඩි දියුණු වීම් අවස්ථා රාශියක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙන් කයිසෙන් ආයතනිකගත කරයි. ඒ අනුව කුඩා වැඩි දියුණු වීම් රාශියක එකතුවක් ලෙස කයිසෙන් හැඳින්විය හැක.

3. කයිසෙන් සඳහා නිර්මාණශීලි චින්තනයක් අවශ්‍ය වේ. පවතින තත්ත්වය හොඳින් අධ්‍යයනය කර වැඩි දියුණු කළ යුතු අවස්ථා සඳහා යොමු වීම සිදු වේ. ඒ අනුව පුළුල් දැක්මක් සහිතව කරුණු අධ්‍යයනය කරමින් විසඳුම් ලබා දීමට ක්‍රියා කරයි.

4. ආයතනයක ඕනෑම මට්ටමකින් ක්‍රියාත්මකකළ හැකි වීම තවත් වැදගත් ලක්ෂණයකි.ඕනෑම ආයතනයක(පාසලක,කර්මාන්තශාවක ,කාර්යාලයක)පහසුවෙන් ක්‍රියාත්මක කළ හැක. තවද ඉහළ පහළ මට්ටම් අතර භේදයකින් තොරව කයිසෙන් හඳුන්වා දිය හැකි අතර ඇතැම් විට කෙටි පුහුණුවක් අවශ්‍ය වේ.


## 1.3 කයිසෙන් සහ නව්‍යකරණය (Kaizen and Innovation)

කයිසෙන් සේම වැදගත් උපායමාර්ගයක් ලෙස නව්‍යකරණය හැඳින්විය හැක. කයිසෙන් හි දී සුළු සුළු වැඩි දියුණු කිරීම් කෙරෙහි යොමු වන විට නව්‍යකරණයේ දී විශාල වැඩි දියුණුවීම් කෙරෙහි අවධානය යොමු කරයි. කයිසෙන් ක්‍රමය සහ නව්‍යකරණය අතර පවතින සම්බන්ධතාවය පහත රූප සටහනින් හා විස්තරයෙන් මනාව පැහැදිලි වේ.




ඉබ්බා සුළු පියවර තබමින් සෙමෙන් සෙමෙන් ඉහළට ගමන් කරයි. නමුත් හාවා විශාල පිම් පනිමින් ඉහළට ගමන් කරයි. මෙහිදී ඉබ්බාගේ ගමන කයිසෙන් ක්‍රමයට ද හාවාගේ පිම් පැනීම නව්‍යකරණයට සමාන කළ හැක. කාලයත් සමග සුළු, කෙටි පියවර තබමින් දියුණු වීම කයිසෙන් යටතේ කෙරෙන නිසා කයිසෙන් ක්‍රමය පිළිපැදීම පහසු ය. විශේෂඥ දැනුමක් හෝ සම්පත් ඒ සඳහා අවශ්‍ය නොවේ. නමුත් නව්‍යකරණය ක්‍රියාත්මක කිරීමට විශේෂඥ දැනුමක් හා ඉහළ ප්‍රාග්ධනයක් අවශ්‍ය වේ. එම නිසා අපට පහසුවෙන් කයිසෙන් ක්‍රියාත්මක කළ හැක.

ඉහතින් විස්තර කරන ලද ඉබ්බාගේ සහ හාවාගේ පිම් පිළිබඳව තවදුරටත් පහත රූප සටහනෙන් මනා අවබෝධයක් ලබාගත හැක. කාලයත් සමග සිදුවන වර්ධනයේ වෙනස සැලකිල්ලට ගැනීමෙන් කයිසෙන් ක්‍රියාත්මක වීමේදී සුළු, කෙටි පියවර දැකිය හැක. නව්‍යකරණයේ දී දිගු, ක්ෂණික පියවර දක්නට ලැබේ.




මීට අමතරව කයිසෙන් හා නව්‍යකරණය පිළිබඳව පුළුල් සංසන්දනයක් පහත වගුවෙන් දැක්වේ. නව්‍යකරණයට වඩා පහසුවෙන් සාමාන්‍ය ජනයාට කයිසෙන් සංකල්පය ක්‍රියාත්මක කළ හැකි බවට පැහැදිලි ඉඟියක් එම වගුව පරිශීලනයෙන් ඔබට ලැබෙනු ඇත.

| කයිසෙන් (Kaizen) | නවයකරණය (Innovation) |
|---|---|
| කුඩා පියවර තබයි | විශාල පියවරක් තබයි |
| අඛණ්ඩව ක්‍රියාත්මකයි | අඛණ්ඩව ක්‍රියාත්මක නොවේ |
| සියලු දෙනාම සහභාගි වේ | තෝරාගත් කොටසක් සහභාගි වේ |
| සාමූහිකත්වය, කණ්ඩායම් වැඩ පරිසරයක් බිහි කරයි. | ඒක පුද්ගල හැකියාවන්ට ප්‍රමුඛතාවයක් ලබා දේ |
| නඩත්තු කිරීම සහ වැඩි වර්ධනයට යොමු වේ. | පවතින ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කර නැවත ගොඩ නැංවීම සිදු වේ. |
| සාමාන්‍ය දැනුමක් තිබීම ප්‍රමාණවත්ය. | විශේෂඥ, තාක්‍ෂණික දැනුමක් අවශ්‍ය වේ. |
| අඩු ප්‍රාග්ධනයකින් කළ හැක | ඉහළ ප්‍රාග්ධනයක් අවශ්‍ය වේ |
| මිනිසුන් (People) මූලිකම කාර්යභාරය ඉටු කරයි. | තාක්‍ෂණය ප්‍රධානම කාර්යභාරය ඉටු කරයි. |





කයිසෙන් හා නව්‍යකරණය හදුනා ගැනිමට සරල උදහරණයක් සලකා බලමු. සෑම නිවසකම පාහේ ඇති රූපවාහිනිය ගැන මඳක් සිතා බලන්න.රූපවාහිනිය සොයා ගත් නිර්මාපකයා ලෙස සැලකෙන්නේ ජෝන් ලොගි බෙයාර්ඩ්ය. නමුත් ඔබ අප අද දිනයේ දී නරඹන්නේ ජෝන් ලොගි බෙයාඩ් විසින් නිර්මාණය කරන ලද රූපවාහිනිය නොවේ. කාලයක් සමඟ සිදු කරන ලද කයිසෙන් ක්‍රියාකාරකම් සහ නව්‍යකරණයන් (වර්ණ රූප-වාහිණී, පැතිලි තිර, LCD / LED රූපවාහිනි ) රාශියක් මගින් අද දින අප නරඹන රූපවාහිනිය දක්වා වර්ධනය වී ඇත.


දිනෙන් දින කුමන හෝ වෙනස්කම් සිදුකරමින් පවතින තත්ත්වය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම තුළින් ඵලදායිතාව වර්ධනය කර ගත හැක. සරල උදහරණය-ක් ලෙස රූපවාහිනී යන්ත්‍රයක දුරස්ථ පාලකය නිසා පහසුවෙන් රූපවාහිනී නාලිකා මාරු කර ගත හැක. හඬ අඩු වැඩි කළ හැක. පෙර තත්වයට වඩා වැඩි දියුණු අවස්ථාවක් මෙලෙස ළගා කර ගැනිමට අවස්ථාව සැලසුනේ කුඩා වැඩි දියුණු කිරීම් නිරන්තරයෙන් අඛ-ණ්ඩව ක්‍රියාත්මක කිරීම නිසාය.

දැන් ඔබට කයිසෙන් ක්‍රමය පිළිබඳව මූලික අදහසක් ලැබී ඇති නිසා කයිසෙන් කුඩය යටතේ එන කයිසෙන් යෝජනා ක්‍රම පිළිබඳව විස්තරාත්මකව සලකා බලමු. ඒ සම්බන්ධව ඊළග පරිච්ඡේදය වෙන් කර ඇත. කයිසෙන් එනම් අඛණ්ඩ වැඩි දියුණුව සඳහා පවුලක සාමාජිකයින්, විදුහලක සිසුන් හා ගුරුවරුන්, ආයතනයක කාර්යමණ්ඩලය තම නිර්මාණශිලි මනස මෙහෙයවමින් ලබා දුන් අපූරු යෝජනා රාශියක් එහි අන්තර්ගතය.

## 1.4 කයිසෙන් කුඩය (The Kaizen Umbrella)

කයිසෙන් ක්‍රමය යටතේ ක්‍රියාත්මක කළ හැකි ඵලදායිතා සංකල්ප සහ ශිල්පක්‍රම Kaizen Tools (කයිසෙන් මෙවලම්) ලෙස හඳුන්වා ඇත. මෙය සාමාන්‍යයෙන් කුඩයක ආකාරයෙන් දක්වයි. ඔබ කයිසෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්‍ෂා කරන විට මින් කයිසෙන් මෙවලම් එකක් හෝ කිහිපයක් හෝ සුදුසු පරිදි යොදා ගත හැක. කයිසෙන් කුඩය යටතේ අන්තර්ගත වන එසේත් නැතිනම් එම කයිසෙන් කුඩයේ සෙවණ ලබන කයිසෙන් මෙවලම් පහත රූප සටහනෙන් දැක් වේ

### KAIZEN tools




**උසස් කයිසෙන් මෙවලම්**

Industrial Engineering
(කාර්මික ඉන්ජිනේරුමය ක්‍රම)

TQM (පූර්ණ තත්ත්ව කළමනාකරණය)

TPM (පූර්ණ ඵලදායි නඩත්තුව)

JIT
( Just In Time ක්‍රමය)

**මූලික කයිසෙන් මෙවලම්**

5S (පංචවිධ සංකල්ප)

visual control (දෘශ්‍ය පාලන ක්‍රම)

Suggestion system (යෝජනා ක්‍රම)

Small group activityies
(කුඩා කණ්ඩායම් ක්‍රියාකාරකම්)

7 QC tool (තත්තව පාලන මෙවලම්)

මෙම කයිසෙන් කුඩයේ වම් පසින් ඇත්තේ මූලික කයිසෙන් මෙවලම් (Basic Kaizen Tools) වන අතර දකුණු පසින් දැක්වෙන්නේ උසස් කයිසෙන් මෙවලම් (Advanced Kaizen Tools ) වේ. ආයතනයට සහ ක්‍රියාවලියට ගැළපෙන පරිදි වඩාත්ම උචිත කයිසෙන් මෙවලම හෝ මෙවලම් තෝරා භාවිතා කරමින් ඉහළ ඵලදායිතා වර්ධනයක් ළඟා කර ගත හැක.

# කයිසෙන්
# යෝජනා ක්‍රමය

දෙවන පරිච්ඡේදය

" ජපන් ජාතික සේවකයින්ගේ දක්නට ලැබෙන මූලික ගුණාංගයක්
වන්නේ ඔවුන් තම දෑත හා
සමානවම මොළය ද යොදා ගැනීමයි. වාර්ෂිකව අපගේ සේවකයින්
යෝජනා මිලියන 1.5 ක්
ලබාදෙන අතර ඉන් 95% ක් පමණ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි
යෝජනා වේ".

**Eiji Toyoda**
ටොයෝටා සභාපති

## 2.1 කයිසෙන් යෝජනා ක්‍රම (Kaizen Suggestion Scheme)

කයිසෙන් සම්බන්ධව සලකා බලන විට සමාජයේ පවතින්නේ එය හුදෙක් යෝජනා ලබාදීමේ ක්‍රමයක් පමණක් ලෙසය. නමුත් ඒ කයිසෙන් යනු ඉන් ඔබ්බට ගිය උපායමාර්ගයක් බව ඔබට කයිසෙන් කුඩය (Kaizen Umbrella) තුළ අන්තර්ගත කයිසෙන් මෙවලම් අධ්‍යයනය කිරීමෙන් තහවුරු වනු ඇත. එහෙත් කයිසෙන් යෝජනා සම්බන්ධව විශේෂයෙන් සාකච්ඡා කළ යුත්තේ එය පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි වීමත්,වඩාත් සරල වීමත් සහ සියලු දෙනාගේම සහභාගිත්වය ලබා ගැනීමට අවස්ථාව ලැබීමත් නිසාය.

කයිසෙන් යෝජනා ක්‍රම ප්‍රධාන වශයෙන් ආකාර දෙකකි.

1. පුද්ගල මූලික කයිසෙන් යෝජනා (Individual Base Kaizen Suggestion)
2. කණ්ඩායම් මූලික කයිසෙන් යෝජනා (Group Base Kaizen Suggestion)

මෙම ක්‍රම දෙක විස්තරාත්මකව සලකා බලමු.

### 2.1.1 පුද්ගල මූලික කයිසෙන් යෝජනා

මෙහිදී සිදුවන්නේ ආයතනයක/පාසලක/කර්මාන්තශාලාවක සිටින පුද්ගලයින්ගේ යෝජනා ලැබීමත් ඒවායින් වඩාත් ප්‍රායෝගික යෝජනා ක්‍රියාත්මක කිරීමත් ය. ඒ සඳහා පුද්ගලයින් ආකාර දෙකකට සහභාගි වේ.

1. යෝජනා පෙට්ටි.

ආයතනයක විවිධ ස්ථානවල යෝජනා පෙට්ටි ඇති අතර සේවකයෝ ඒවාට යෝජනා බහාලති. වැඩ කරන විට, විවේක වේලාවන් හි දී යෝජනා මෙම පෙට්ටිවලට දමන අතර නිශ්චිත කාලයක දී (දිනපතා/සතිපතා) එම පෙට්ටි පාලනාධිකාරීය විසින් විවෘත කර ප්‍රායෝගික යෝජනා ක්‍රියාත්මක කිරීමට පෙළඹේ. යෝජනා දැමීම සඳහා නිශ්චිත ආකෘතියක් බොහෝ විට දක්නට නැත.

2. කයිසෙන් යෝජනා පත්‍ර

කයිසෙන් යෝජනා පත්‍රයක මූලික ආකෘතියක් ඇත. එම ආකෘති පත්‍රය භාවිතයෙන් සේවකයින් යෝජනා ලබා දෙන නිසා නිරවුල් හා නිරවද්‍ය යෝජනා බොහෝ විට ලැබේ. මෙම ආකෘති පත්‍රවල යෝජනා සටහන් කර බොහෝ විට පෙට්ටිවලට දමයි. නැතහොත් නම් කරන ලද අයෙකුට භාර දීම සිදු වේ. එවැනි කයිසෙන් යෝජනා පත්‍රයක ආකෘති වර්ග දෙකක් පිටු අංක 2-10 හා 2-11 හි දැක්වේ.

## 2.1.2 කණ්ඩායම් මූලික කයිසෙන් යෝජනා

කයිසෙන් යෝජනා ලබා දීම තනි තනි වශයෙන් නොව කුඩා කණ්ඩායම් ලෙස සිදු වේ. එම කුඩා කණ්ඩායම් එක් රැස් වී ගැටලු හඳුනාගෙන විශ්ලේෂණය කර විසඳුම් යෝජනා කරති. එවැනි කුඩා කණ්ඩායම් රාශියක් ආයතන තුළ ඇති අතර ඒ සඳහා උදාහරණ කිහිපයක් සලකා බලමු.

1. තත්ත්ව කව

   තත්ත්ව කව පිළිබඳව ඔබට අමුතුවෙන් හඳුන්වා දිය යුතු නොවේ.ආයතනයක ක්‍රියාවලි වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන කව සාමාජිකයෝ විවිධ යෝජනා ලබා දෙති. තත්ත්ව කව යන නම භාවිතා නොවුණත් වෙනත් නම් වලින් (කාර්යාභිවර්ධන කව, ඵලදායිතා වර්ධන කව) ක්‍රියාත්මක වන අවස්ථා දක්නට ඇත

2. ස්වයං කළමනාකරණ කණ්ඩායම් (Jishu-kanri Team)

   තත්ත්ව කවවලට වඩා වැඩි වර්ධිත අවස්ථාවකි.තත්ත්ව කවවලට වඩා පුළුල් ලෙස කටයුතු කරමින් ආයතනයේ වර්ධනයට ඉවහල් වන කයිසෙන් යෝජනා ලබා දීම සිදුකරයි.


3. ශූන්‍ය දෝෂ කව (Zero-Defects Circle)

   උපරිම ගුණාත්මකභාවයක් සඳහා දෝෂ අවම කිරීමට හෝ ශූන්‍ය කිරීමට(මෙය අපහසු ඉලක්කයකි) මෙවැනි කණ්ඩායම් විවිධ කයිසෙන් ක්‍රියාකාරකම් වල නිරත වෙති


## 2.2 කයිසෙන් යෝජනා ක්‍රමය සහ සේවක මණ්ඩල යෝජනා ක්‍රමය (Kaizen suggestions scheme and staff suggestions scheme)

කයිසෙන් ක්‍රමයේ දී මෙන්ම සේවක යෝජනා ක්‍රමයේදී ද ආයතනයේ වැඩි දියුණුව උදෙසා වූ යෝජනා රාශියක් ලැබේ. ඇතැම් ආයතනවල යෝජනා පෙට්ටි දැකිය හැකි අතර සේවකයින් විසින් ඒවාට යෝජනා බහාලනු ලැබේ. එලෙසම කයිසෙන් යෝජනා පත්‍රවල සටහන කරන ලද කයිසෙන් යෝජනා ද සේවකයින් වෙතින් ලැබේ. ආරම්භක අවස්ථාවේ දී කයිසෙන් ක්‍රමය සහ සේවක යෝජනා ක්‍රමය අතර සමානකමක් මතුපිටින් දක්නට ලැබුනත් ක්‍රමවේදය තුළ එවැන්නක් නැත.

පළමුව සේවක යෝජනා ක්‍රම වල ක්‍රියාකාරීත්වය සලකා බලමු.





යන ප්‍රධාන ක්‍රියාවලි හතර තුළදී සේවක යෝජනා ක්‍රම පවතින ආයතනයක සේවකයින්ගේ හා කළමනාකාරීත්වයේ වගකීම් පහත පරිදි නිරූපණය කළ හැකිවේ.




මෙම ක්‍රමයේදී සේවකයින් ගැටලු හඳුනාගෙන ඒ සඳහා විවිධ විසඳුම් රාශියක් ලබා දේ. නමුත් ඒවායින් වඩාත් ගැළපෙන විසඳුම තෝරා එය ක්‍රියාත්මක කිරීමත්, යෝජනා ඇගයීමක් සිදු කර හොඳම යෝජනාවට ත්‍යාග/සහතික ලබාදීම වැනි දේ කළමනාකාරිත්ව වගකීම් වේ.

මේ නිසාම ආයතනයේ ඕනෑම ක්‍රියාකාරකමක් සම්බන්ධව යෝජනා ලබා දීමද සිදු වේ.

දෙවනුව කයිසන් යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සලකා බලමු





මෙහිදී සේවකයින් තම තමන්ගේ විෂය පථයට අදාළ ගැටලු හඳුනාගෙන, ඊට විසඳුම් ලබා දී ඔවුන් විසින්ම ඒවා ක්‍රියාත්මක කරයි. හොඳම යෝජනා සලකා ඇගයීම සහ අවශ්‍ය අනුමැතිය ලබා දීම කළමනාකාරීත්වය ඉටු කරයි.

තවද කයිසන් ක්‍රමයේ දී සේවකයන් තම විෂය පථය තුළ වැඩි දියුණු කළ අවස්ථා සඳහා ක්‍රියාකාරී වේ

## 2.3 කයිසෙන් යෝජනා සඳහා උදාහරණ


### යෝජනා අංක 1




මුළුතැන්ගෙයි ඇති සින්ක් එක තුළ ඉඳුල් හා එළවළු සේදිමේදි ඉවත ලන ඝන ද්‍රව්‍ය එකතු වී ජලය බැස නොයන අවස්ථා බොහෝ විට නිරීක්ෂණය වේ.මෙවැනි අවස්ථාවකදී අවහිර වු ඝන ද්‍රව්‍ය ඉවත් කිරිමට පයිප්ප බට ගලවා පිරිසුදු කිරීමට සිදුවේ. එම නිසා කාලය අපතේ යෑමක් මෙන්ම ජල නල පද්ධතියට හානි විමක් සිදු විය හැක.

මෙය වළක්වා ගැනීම සඳහා කයිසෙන් යෝජනාවක් ලෙස සින්ක් එක තුළ ප්ලාස්ටික් කූඩයක් තැන්පත් කරන ලදි. ඉවත ලන ඝන ද්‍රව්‍ය එම කූඩයේ රැදෙන නිසා පයිප්ප බටය තුළට ඇතුළු විමක් සිදු නොවන අතර මෙය ඉතා පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි කයිසෙන් යෝජනාවකි.

### යෝජනා අංක 2




කයිසෙන් ක්‍රමය භාවිතයෙන් හිරමණය වැඩිදියුණු වී ඇති ආකාරය මෙම රූප සටහන් බැලීමෙන් ඔබට වටහා ගත හැක. සාම්ප්‍රදායික හිරමණය වෙනුවට වඩාත් පහසු ඉරියව්වකින් හා ඉක්මනින් පොල් ගෑම සඳහා හිරමණය, කයිසෙන් පියවර ගණනාවක් ඔස්සේ වැඩි දියුණු කර ඇත.. තවද කැරපොත්තන් මීයන් ආදී සතුන් හිරමණ තලය වෙත පැමිණිම වැළැක්විම සඳහා ආවරණයක්ද යොදා ඇත.

## යෝජනා අංක 3


මෙයින් දැක්වෙන්නේ පාසලක සිදු කළ කයිසෙන් ක්‍රියාකාරකමකි. එහිදී පාසලේ පුස්තකාලය වෙත සිසුන්ගේ යොමු වීම අඩු බව විදුහල්පති තුමාට නිරීක්ෂණය විය.විවේකයක් ලැබෙන සෑම අවස්ථාවකදීම සිසුහු පොත් කියවීමට වඩා සෙල්ලම් කිරීමට ප්‍රියතාවයක් දැක්වූහ. පුස්තකාලය වෙත සිසුන් යොමු කර ගැනීම උදෙසා විදුහල්පතිතුමා විසින් අපූර්ව කයිසෙන් යෝජනාවක් ක්‍රියාත්මක කරන ලදි. එහිදී විශාල ගසක අතු පතර අලංකාර හා සුරක්‍ෂිත කුටියක් ඉදිකර එයට නැගීමට ලී වලින් පඩිපේලියක්ද සකස් කළේය. බිම තිබූ පුස්තකාලය ගස මත අලුතෙන් තනන ලද කුටිය තුල අට්ටාල පුස්තකාලය (ගුවන් පුස්තකාලය) යන නමින් නැවත ස්ථාපිත කළේය.









මෙම අට්ටාල පුස්තකාලය වෙත ගොස් පොත් පත් කියවීමට සිසුහු ඉමහත් රුචිකත්වයක් දැක්වූහ. සිසුන්ගේ කියවීමේ රුචිය වැඩි වූ නමුත් විදුහල්පතිතුමාට තවත් දුර්වලතාවයක් පසු කලකදී නිරීක්ෂණය විය. එනම් අට්ටාල පුස්තකාලයේ ඇති පොත් පත් වලින් සිංහල පොත් පරිශීලනය වුවත් ඉංග්‍රිසි පොත් පත් පරිශීලනය නොවන බවයි. එයට ද නැවත වරක් කයිසෙන් යෝජනාවක් ඇසුරෙන් විසඳුමක් දෙන ලදි. එනම් අට්ටාල පුස්තකාලයේ තිබූ සිංහල පොත් පත් ඉන් ඉවත් කර පරණ පුස්තකාලයේ නැවත තැබීමත් ඉංග්‍රිසි පොත් පත් පමණක් අට්ටාල පුස්තකාලයේ තැබීමත් කරන ලද්දේ ඉංග්‍රිසි මාධ්‍ය පොත් පත් භාවිතයට යොමු කිරීමේ අරමුණ පෙරදැරිවය.





මීට වසර කිහිපයකට පෙර බොහෝ පාසල් හි ප්‍රාථමික පන්ති වල සිසුන් තම පුටුවේ අසුන් ගන්නේ බෑගය හා වතුර බෝතලය පුටුවේම තබා ගනිමිනි. මෙහිදී සිසුවාට නිසි පරිදි වාඩි වීමට පුටුවෙහි ඉඩ කඩ ප්‍රමාණවත් නොවන්නේ බෑගය එහි තිබීම නිසාය.මීට පිළියමක් ලෙස කයිසෙන් යටතේ එන 5s ක්‍රියාත්මක කර සිසුන්ගේ වතුර බෝතල් තැබීමට වෙනම ස්ථානයක් සකස් කර ඒවා අංකනය හෝ නාමකරණය කරන ලදි. එලෙසම බෑග් එල්ලීම සඳහාද කටයුතු කරන අතර පහසු ඉරියව්වකින් පුටුවේ වාඩි වී ඉතා හොඳින් තම අධ්‍යාපන කටයුතු කර ගෙන යාමට අවස්ථාව ලැබුණු අතර මෙය පාසල් පද්ධතිය තුළ කයිසෙන් ක්‍රමය යොදා ගත් තවත් උදාහරණයක් වේ.




කාර්යාලයකදී පමණක් නොව නිවසේදීත් පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි කයිසෙන් ක්‍රියාකාරකමක් උක්ත රූප සටහන් වලින් දැක්වේ. දුරකථන ඇමතුමක් අවසන් වූ පසු අප විසින් රිසිවරය ක්ෂණිකව තබයි. ඇතැම් විට අනෙක් අන්තයේ සිටින ග්‍රාහකයා ඒ වන විටත් දුරකථනයේ රැඳී සිටිය හොත් ඔහුට / ඇයට, එම රිසිවරය තබන ශබ්දය පීඩාවක් ලෙස දැනේ. මෙය වළක්වා ගැනීමට ඉතා අඩුවියදමකින් රිසිවරය තබන ස්ථානයේ ස්පොන්ජ් කැබැල්ලක් ඇලවිය හැක. දුරකථනයේ අනිත් අන්තයේ සිටින්නා කෙරෙහි ඔබගේ ඇති ආචාරශිලිත්වය හා ඔහු / ඇය අපහසුතාවයට ලක් නොකිරීමට ඔබ ගන්නා උත්සාහයට කදිම නිදසුනක් හා පහසු කයිසෙන් ක්‍රියාකාරකමක් ලෙස මෙය සැලකිය හැක.





බර කිරීමට අවශ්‍ය රෝල තරාදියේ තැටිය මත ඔසවා තැබීමට සිදුවේ. නමුත් කයිසෙන් යෝජනාවක් අනුව තරාදියේ තැටිය පොළව මට්ටමට සමාන්තරව තිබෙන සේ ගෙබිම තුළට ඇතුළු කරයි එවිට රෝල පහසුවෙන් තරාදියේ තැටියේ තැබිය හැක. වෙහෙස අඩු වන නිසා වැඩි ශ්‍රම ඵලදායිතාවයක් ලැබේ ( රෝල පොළව සමඟ ස්පර්ශ වීම වළක්වා ගැනීමට කටයුතු කිරීම වැදගත් වේ)





පොල් තෙල් පහනක් දැල්වීමේදී කයිසෙන් ක්‍රමය මගින් සිදුකළ හැකි සරල වැඩිදියුණු කිරීමක් මෙයින් දැක්වේ. උත්සව සභාවකදී ආරාධිතයින් පොල් තෙල් පහන දැල්වීම සඳහා ඉටිපන්දමක් ගෙන බෝහෝ වේලාවක් තිරය වෙතට යොමු කරගෙන සිටින අවස්ථා අනන්තවත් ඔබ දැක තිබෙනු නොඅනුමානය. මෙහිදී කාලය ගත විම මෙන්ම ආරාධිතයින් අපහසුතාවයට පත්වීම ද සිදුවේ.

එය වලක්වා ගැනීම සඳහා කුඩා කපුරු කැබැල්ලක් තිරය අසල තැබිය හැක. නැතහොත් ද්‍රව කපුරු  වලින් තිරයේ අග පෙඟීම කළ හැක




මෙයින් දැක්වෙන්නේ දුම්රිය ස්ථානයක පිටවීම සහ ඇතුළුවීම සඳහා වු පියගැටපෙළේ කයිසෙන් ක්‍රියාත්මක කළ ආකාරයයි. ඇතුළුවීම සහ පිටවීමට වෙන වෙනම මාර්ග දක්වා වෙන් කළ ප්‍රදේශ මුල්කාලයේ දී නොතිබුණි. මේ නිසා මගීන්ට විවිධ අපහසුතාවලට මුහුණපෑමට සිදුවිය. නමුත් ඇතුළුවීමට දකුණුපසද පිටවීමට වම්පසද ලෙස වෙන් කර තැබීම වැටක් භාවිතයෙන් සිදු කළේය. මේ නිසා අවහිරතාවයකින් තොරව ඔබ මොබ යෑමට දුම්රිය මගීන්ට අවස්ථාව ලැබුණි.




මෙය මොන්ගෝලියාවේ සිදු වූවකි. සතුන්ට විවිධ ලෙඩ රෝග වැළඳෙන අතර ඉන් වැළකීමට සතුන් ඖෂධීය පොකුණකින් සෝදා පිරිසිදු කරයි. ඖෂධීය පොකුණට දැමූ පසු සතා හිස, ජල මට්ටමින් ඉහළ තබා ගෙන සිටින අතර එවිට හිසේ සිටින පරපෝෂිතයින් විනාශ නොවේ. ඒ සඳහා පොකුණ ඉවුරේ සිටින මිනිසෙක් ලී මිටකින් සතුන්ගේ හිස ස්වල්ප වේලාවකට ඔබයි. මෙය ඉතා වෙහෙසකර කාර්යයක් වන නිසා ඔහු ඒ සඳහා කයිසෙන් යෝජනාවක් ගෙනාවේය.

එහිදී සිදු කළේ පොකුණ පතුලේ නොගැඹුරු වලක් කැපීමය. සතා පොකුණට බැස ගමන් කරන විට නොදැනුවත්ව ම නොගැඹුරු වලේ වැටෙන අතර එවිට හිස පහතට යෑමෙන් සතාගේ හිස ඖෂධීය ජලයෙන් නැහැවේ. යම් කිසි අන්තරායක බවක් දක්නට ලැබුණත් මෙය නිර්මාණශීලි කයිසෙන් යෝජනාවකි.

පෙර සඳහන් කරන ලද උදහරණ සැලකුවිට පෙනී යන්නේ, ඒවා ඉතා පහසුවෙන්, අඩු වියදමකින් හා කෙටි කාලයකින් ක්‍රියාත්මක කළ හැකි නිර්මාණශීලි යෝජනා බවයි. පොදුවේ සැලකු කළ ඕනෑම උපකරණයක,ක්‍රියාවලියක, භාණ්ඩයක හෝ සේවාවක අඛණ්ඩ වැඩි දියුණුව සඳහා පහත ක්‍රියාමාර්ග අවශ්‍යතාව පරිදි ගත හැක.

Eliminate – සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමේ හැකියාව සොයා බැලීම.

Reduce – අඩු කිරීමේ හැකියාව සොයා බැලීම.

Discontinue – සම්බන්ධතාවයක් බිඳීම.

Remove – ගලවා ඉවත් කිරීම.

Simplify – සරල කිරීම

Do Simultaneously – එක්වර කාර්යයන් කිහිපයක් කිරීම.

Combine – කාර්යයන් කිහිපයක් එකතු කිරීම.

Modify – නවීකරණය කිරීම.

Alternate – විකල්ප ක්‍රියාත්මක කිරීම.

Delegate – බෙදා හැරීම

Interchange – අතරමැදි වෙනස්කම් සිදු කිරීම.

Rearrange – නැවත සැකසීම

ඒ අනුව ගැටළු හඳුනාගෙන ඊට විසඳුම් ලෙස කයිසෙන් යෝජනා ලබාදීමේදී උක්ත සඳහන් කරන ලද ක්‍රමයන් කෙරෙහි අවධානය යොමු කිරීම වටිනේය.

## 2.4 කයිසෙන් යෝජනා පත්‍ර

ආයතනයක කයිසෙන් යොජනා ලබාගැනිම සඳහා සකස් කරන ලද කයිසෙන් යෝජනා පත්‍රයක ආකෘතියක් පහතින් දැක්වේ. සමහර ආයතනවල මෙය කයිසෙන් කාඩ් (Kaizen Card) ලෙස වඩාත් සරල කර ඇත.

<u>කයිසෙන් යෝජනා පත්‍රය</u>

නිරීක්ෂිත ගැටළුව ........................................................

...............................................................................

...............................................................................

යෝජනාව ..................................................

...............................................................................

...............................................................................

ලැබිය හැකි ප්‍රතිඵල ....................................................

...............................................................................

...............................................................................

යෝජකයාගේ නම ......................................................

අත්සන ............................... දිනය .............................

සමහර ආයතනවල මීට වෙනත් ආකාරයක යෝජනා පත්‍ර භාවිතා වේ. එවැනි උදාහරණයක් පහතින් දැක්වේ

**<u>කයිසෙන් යෝජනා පත්‍රය</u>**

ක්‍රියාවලිය ...........................................................

| දැනට පවතින තත්වය | |
|---|---|
| (විස්තරය) | (රූ සටහන) |

| යෝජිත විසඳුම | |
|---|---|
| (විස්තරය) | (රූ සටහන) |

යෝජකයාගේ නම ....................................................

අත්සන ............................... දිනය ...........................


සුපරීක්ෂක නිර්දේශය ................................................


කළමනාකරුගේ අනුමැතිය ..........................................

එලෙස සකසන කයිසෙන් යෝජනා පත්‍ර පහසුවෙන් ගත හැකි පරිදි තැබීම අත්‍යවශ්‍ය වේ.ආයතනයක දියුණුව සඳහා තම යෝජනා අවශ්‍ය බව සේවකයින්ට එත්තු ගැන්වීමට කටයුතු කිරීම වැදගත්ය. තම ක්‍රියාකාරකම් ආශ්‍රිතව තමන් විසින්ම යෝජනා ලබාදීම තුළින් ආත්ම තෘප්තියක් හා ස්වාභිමානයක් සේවකයින් තුළ ඇති වේ. කර්මාන්තශාලාවක සේවකයකුගේ ලැබුනු කයිසෙන් යෝජනාවක් පහතින් දැක්වේ.

**කයිසෙන් යෝජනා පත්‍රය**

ක්‍රියාවලිය ....පින්තාරු කිරීම....

| දැනට පවතින තත්ත්වය | |
|---|---|
| යන්ත්‍රය පින්තාරු කිරීමට ආකාරකයක් නොමැති බැවින් යන්ත්‍රය වරින් වර ඔසවා ස්ථානය මාරු කරමින් පින්තාරු කිරීමට සිදුවේ. ඒ සඳහා අමතර ශ්‍රමයක් හා අමතර කාලයක් වැයවේ. (විස්තරය) |   (රූ සටහන) |

| යෝජිත විසඳුම | |
|---|---|
| යන්ත්‍රය පින්තාරු කිරීමට භ්‍රමණය කළ හැකි පුවරුවක් යොදා ගත හැකි නම් පුවරුව භ්‍රමණය කරමින් යන්ත්‍රය පින්තාරු කළ හැක. එවිට කාලය හා ශ්‍රමය ඉතිරි වේ. (විස්තරය) |   (රූ සටහන) |

යෝජකයාගේ නම ....W.A. චිතුලාල්....

අත්සන ....[signature]....  දිනය ....2011/03/24....

සුපරීක්ෂක නිර්දේශය ....[signature]....

කලමනාකරුගේ අනුමැතිය ....යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරමි.

[signature]
2011/03/31

කෙසේ වෙතත් පහත ආකාරයේ යෝජනා, කයිසෙන් යෝජනා ලෙස නොසැලකේ

1 වැටුප්, උසස්වීම්, පරිපාලනය, සම්බන්ධ ගැටලු, විනය ක්‍රියාමාර්ග වැනි විෂයන් සම්බන්ධව පැමිණිලි හෝ දුක් ගැනවිලි

2 විසඳුමක් සඳහන් කර නොමැති පැමිණිලි

3 විශේෂිතව දක්වා නැති (පොදුවේ විස්තර කර ඇති) යෝජනා

4 කලින් ඉදිරිපත් වූ යෝජනාවක් නැවත ඉදිරිපත් වූ අවස්ථා

5 සේවකයන්ගේ පාලනයෙන් බැහැර ප්‍රතිපත්ති, නීති රෙගුලාසි සම්බන්ධ කරුණු

## 2.5 කයිසෙන් යෝජනා ඇගයීම

ආයතනයක කාර්යමණ්ඩලය විසින් ලබාදෙන යෝජනා ඇගයීම් තුළින් කාර්යමණ්ඩලය අභිප්‍රේරණය වේ. කයිසෙන් යෝජනාවක් ඇගයීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු කිහිපයකි.

(අ) එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට ගත වන කාලය
(ආ) යෝජනාවේ සරල බව
(ඇ) වියදම් අඩු වීම
(ඈ) නිර්මාණශීලීත්වය

මෙම නිර්ණායක අනුව හොඳම යෝජනාව තෝරා ඇගයීම කළ හැක. ඒ සඳහා වාචික හා ලිඛිත ප්‍රශංසා, ත්‍යාග ලබා දීම හා මුදල් ප්‍රදානයන් ලබාදීම යනාදි ක්‍රියාමාර්ග ගත හැක. කාර්යයන්ට අදාළව අඛණ්ඩ වැඩි දියුණුව සඳහා යෝජනා ලබා දීමට අවශ්‍ය පරිසරය බිහිකිරීම කළමනාකාරීත්වයේ වගකීමකි. එවැනි යහපත් වටපිටාවක් තුළ වැඩිපුර සේවක යෝජනා ලබාදීමට අනිවාර්යයෙන්ම කාර්යමණ්ඩලය පෙළඹෙනු නොඅනුමානය.

# Gemba Kaizen
# ගෙම්බා කයිසෙන්

මේවන විට කයිසෙන් පිළිබඳව ඔබට පුළුල් දැනුමක් ඇති බව නොඅනුමානය.නමුත් Gemba යන පදය ඔබට ආගන්තුක වනු ඇත. Gemba යන පදය ද ජපන් භාෂාවේ වචනයක් වන අතර එහි ඉංග්‍රීසි අර්ථය " The real workplace" ලෙස හැඳින්විය හැක. එනම් අපගේ කාර්යයන්ගෙන් ප්‍රධානම වැඩ කොටස සිදු වන ස්ථානය යි. " Gemba is where value is added " ලෙසද හැඳින්විය හැක.එනම් යම්කිසි කාර්යකට අගය එකතුවන ස්ථානය Gemba වේ.

බොහෝ කළමනාකරුවෝ තම ආයතනයේ පුටුවක වාඩි වී විවිධ වාර්තා අධ්‍යයන කරමින් ආයතනික වර්ධනයට කටයුතු කරති. නියම සේවා ස්ථානයට බැහැරව මෙසේ කටයුතු කරමින් විවිධ රැස්වීම් පවත්වමින් කළමනාකරණයේ යෙදෙන අවස්ථා දක්නට ලැබුණත් එහි සාර්ථකත්වය පිළිබඳව සෑහීමකට පත්විය නොහැක. නමුත් Gemba Management (ගෙම්බා කළමනාකරණය) යටතේ දී ක්‍රියාවලීන් හා ඒවායේ ප්‍රගතිය අදාළ ස්ථානයට ම ගොස් විමසා බැලීම සිදු වේ. ගැටලුවක් ඇති වූ විට කාර්යාලයීය කාමරයේ සිට වාර්තා පරීක්ෂා කිරීමෙන් නොව එම ගැටලුව ඇති වූ ස්ථානයට ගොස් විසඳුම් ලබා දීම සිදු වේ. එනම් නිරන්තරයෙන් Gemba වෙතට යයි.

මේ අනුව Gemba Kaizen ක්‍රියාත්මක කිරීමේ දී ගැටලුවක් ඇති වූ වහාම Gemba වෙතට ගොස් පළමු විසඳුම් ලබා දීමට උත්සාහ කරයි. ගැටලුව විශ්ලේෂණය කර පළමුව ස්ථිර විසඳුමක් හෝ තාවකාලික විසඳුමක් ලබා දීමට උත්සාහ කරයි. කළමනාකරණ ක්‍රමවේදයක් ලෙස Gemba Kaizen දැන් වඩාත් ජනප්‍රිය වෙමින් පවතී.

එනම් Gemba Kaizen යනු අපගේ වැඩබිම (Gemba) වෙත ගොස් එහි කයිසෙන් සංකල්ප ක්‍රියාත්මක කිරීමයි. තම වැඩබිමේ, ආයතනයේ ප්‍රධානම රාජකාරිය සිදුවන ස්ථානයේ කයිසෙන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම තුළ එහි ප්‍රතිඵල සෘජුවම සේවකයින්ට ලැබේ.

කයිසෙන් ගැන ඔබගේ අවධානය ප්‍රශ්න තුනක් වෙත යොමු කරවමු.

1. ඔබට යම් ගැටලුවක් පැන නැගුණු විට ඔබ එම ගැටළුව,

    (a) සමස්තයක් ලෙස සලකා කටයුතු කරයි.

    (b) කුඩා කළමනාකරණ කොටස්වලට වෙන් කර ගැනීමට උත්සාහ කරයි.

2. ඔබ එම ගැටලුව විසඳීමට උත්සාහ කරන්නේ,

    (a) සම්පූර්ණයෙන්ම ආරම්භයේ සිටම

    (b) කාර්යය සිදු කරන අතරම සුළු සුළු වෙනස්කම් සිදු කිරීම මඟින්

3. ඔබ,

    (a) කිසිදු දිනක වැඩ ප්‍රමිතීන් වලින් වෙනස්ව රාජකාරි කර නැත.

    (b) කාර්යය ඉටු කිරීමට සුදුසු විකල්ප ක්‍රමයක් ගැන අවධානය යොමුකරයි.

ඉහත ගැටලු 3 ටම ඔබගේ පිළිතුර (b) නම් ඔබ කයිසෙන් ක්‍රියාත්මක කිරීමට සුදුසු ය. දැන් ඔබට කයිසෙන් ඔබගේ පුද්ගලික ජීවිතයේත්, නිවසේත්, පාසලේත්, කාර්යාලයේත්, වැඩබිමේත් ආරම්භ කළ හැක.

එලෙස තනි පුද්ගල හෝ ආයතන මට්ටමින් අඛණ්ඩ වැඩි දියුණුව සඳහා කටයුතු කිරීම උදෙසා කයිසෙන් සංකල්ප නිවැරදි භාවිතයට දායකවීම ලක්වැසි සැමගේ වගකීමකි.

## කයිසෙන් යෝජනා සංග්‍රහයට දායකවීමට ඔබටත් අනගි අවස්ථාවක් ......

පාසලක, වැඩබිමක හෝ කාර්යාලයක ඔබ විසින් ක්‍රියාත්මක කරන ලද කයිසෙන් ක්‍රියාකාරකම් සහ සාමාන්‍ය ජීවිතයේදී,නිවසේදී හඳුනාගත් නිර්මාණශීලී කයිසෙන් වැඩි දියුණුවීම් ඒකරාශිකර සංග්‍රහයක් ලෙස පළකිරීමට ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය කටයුතු කර ඇත. ඔබ දන්නා එවැනි කයිසෙන් ක්‍රියාකාරකම් ඊළග පිටුවේ ඇති ආකෘතිය අනුව පුරවා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වෙත තැපැල් කරන ලෙස හෝ 011 2812162 අංකයට ෆැක්ස් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.


**ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය**

**249,ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.**

**දුරකථනය : 0112812163-66**

**විද්‍යුත් තැපැල : nposl@nps.lk**

**වෙබ් අඩවිය : www.nps.lk**

# කයිසෙන් යෝජනා පත්‍රය

ක්‍රියාවලිය ..................................................................

| දැනට පවතින තත්වය | |
|---|---|
| (විස්තරය) | (රූප සටහන) |

| යෝජිත විසඳුම | |
|---|---|
| (විස්තරය) | (රූප සටහන) |

හොඳම කයිසෙන් යෝජනා තෝරා ඇගයීමට ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය බලාපොරොත්තු වන බැවින් ඔබගේ පහත තොරතුරු ලබාදීමට කාරුණික වන්න.

නම :.................................................................

ලිපිනය :.................................................................

.................................................................

දුරකථන :............................... .....................................

............................. ..................................

දිනය අත්සන

NPS SRILANKA

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ

ප්‍රකාශනයකි